# මල් සමඟ කතා කරන පුංචි දැරිය



තිනුලි සෙහන්සා ජයරත්න

# මල් සමඟ කතා කරන පුංචි දැරිය

තිනුලි සෙහන්සා ජයරත්න

කතාව සහ චිත්‍ර

තිනුලි සෙහන්සා ජයරත්න

මහාමායා බාලිකා විදුහල

4 - D

2026.05.10

ISBN 624211093-8

9 786242 110936

# පිදුම

**පොත් ලියන්නට මා දිරි ගැන් වූ,**

**ආදරණීය දෙමාපියන් ට**

**ගුරු මව්පියවරුන් ට**

**සෙනෙහසින් පුදමි ....**



# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙසට දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මගපෙන් වූ ගුරු භවතුන් ඇතුලු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එකෝමත් එක කාලෙක ලස්සන පුංචි ගමක් තිබුණා. ඒ ගමේ ලස්සන දිය ඇලි, ගංගා, පොකුණු, ඇළ දොළ, කුඹුරු ගොඩාක් තිබුණා. ඒ ගමේ පුංචි කඳු මුදුනක තිබුණු ලස්සන ගෙදරක මලී කියලා පුංචි ගැහැණු ළමයෙක් ජීවත් වුණා. එයාගෙ අම්මයි, තාත්තයි හිටියේ නැහැ. මලීට හිටියේ ආච්චි විතරයි. අම්මයි, තාත්තයි නැති එක ගැන කොච්චර දුක හිතුණත් ආච්චි නිසා මලීට ඒ දුක අමතක වුණා. ඇත්තටම ආච්චි මලීට ගොඩාක් ආදරය කළා. ඒ වගේම මලීත් ආච්චිට ගොඩාක් ආදරෙයි.



මලී ජීවත් වුණේ හරිම ලස්සන ගෙදරක. ඒ ගෙදර වටේටම ලස්සනට මල් වවලා තිබුණා. මල් ගස්වල පාට පාට මල් පිපිලා හරිම ලස්සනයි. සුවඳයි. ඒ මල්වල පැණි බොන්න නිතරම සමනල්ලු, මී මැස්සෝ මලීගෙ වත්තට ආවා. හැමදාම මලී ඒ මල් ගස්වලට පොහොර, වතුර දාල ගොඩාක් ආදරයෙන් රැක බලා ගත්තා. ඒ නිසා ඒ මල් ගස්වල හැම දවසකම ලස්සනට මල් පිපුණා.



අපි හැමෝටම යාලුවෝ ඉන්නවනේ. ඒ වගේ මලීටත් යාලුවෝ හිටියා. හැබැයි එයාගෙ යාලුවෝ අපේ යාලුවො වගේ නෙවෙයි. එයාගෙ යාලුවෝ තමයි මල්. මලීට පුදුම හිතෙන හැකියාවක් තිබුණා. ඒ තමයි මල් එක්ක කතා කරන එක. ඒ වගේම මල් කියන දේවල් මලීට හොඳට තේරුණා. මලී හැමදාම උදේ හවස ඒ මල් එක්ක කතා කළා. එයා දුක සතුට හැම දේම බෙදා ගත්තෙ මල් එක්ක. මලී මල් එක්ක ගොඩාක් සතුටෙන් හිටියා.



එක දවසක් මලී උදේ පාන්දරම අවදි වුණා. වෙනදා පුරුදු විදියටම ඇහැරුණ ගමන්ම මලී මල් වත්තට ගියා. එතකොට මලී දැක්ක දෙයින් මලී හොඳටම පුදුම වුණා. වෙනදා වගේ ඒ මල් හිනාවෙලා මලීව පිළිගත්තේ නෑ. වත්තෙ තියන හැම මලක්ම පරවෙලා තිබුණා. උදේම මල්වල පැණි සොයාගෙන ආපු සමනල්ලු, මී මැස්සො දුකෙන් ඉන්නවා මලී දැක්කා. ඒක දැකපු මලීට ලොකු දුකක් දැනුණා. එයා වත්තෙ තිබුණු බංකුවක වාඩි වෙලා දුකෙන් අඬ අඬා හිටියා.



ටික වෙලාවකට පස්සෙ එයාගෙ ඉස්සරහට ආච්චි කෙනෙක් ආවා. පුළුන් වගේ සුදුම සුදු කොණ්ඩයක් තිබුණ ගොඩක් වයසක ආච්චි කෙනෙක්. බොහෝම අමාරුවෙන් හැරමිටියත් අරන් ආච්චි මලී ලඟට ආවා. ඒ ආච්චි දැකපු මලී පුදුම වුණා. මීට කලින් කවදාවත් මලී එහෙම ආච්චි කෙනෙක් දැකල තිබුණේ නෑ.





"අනේ දරුවෝ... සෑහෙන දුරක ඉඳලා මම පයින් එන්නේ. මට හරිම තිබහයි. මට වතුර ටිකක් දෙන්න පුළුවන්ද?"

ආච්චි වෙවුලන කටහඬින් ඇහුවා.

මලීට ආච්චි ගැන දුක හිතුණා.

"හොඳයි ආච්චි. ආච්චි මේ බංකුවේ වාඩි වෙලා ඉන්න. මම ඉක්මනට ගිහින් වතුර ටිකක් අරන් එන්නම්."

මලී ඉක්මනට ගේ ඇතුළට දුවලා ගිහින් වතුර වීදුරුවක් අරන් ඇවිත් ආච්චිට දුන්නා.

ආච්චි මලීට ස්තූති කරලා වතුර වීදුරුව බිවුවා.



හරිම පුදුමයක් තමයි වුණේ. එක පාරටම මලී ඉස්සරහ මායා යෂ්ටියක් අතින් ගත්ත ලස්සන සුරංගනාවියක් මැවුණා. ඒ සුරංගනාවිට තිබුණේ ලස්සනම ලස්සන දිලිසෙන කොණ්ඩයක්. නිල් පාට ලස්සන ඇස් දෙකක්. ඇඳගෙන හිටියේ ලස්සන දම් පාට ගවුමක්.

මලී ඇස්පිල්ලම් නොගහ පුදුමයෙන් සුරංගනාවිය දිහා බලාගෙන හිටියා.

ඇත්තටම සුරංගනාවියක් තමයි ආච්චි කෙනෙක් විදියට වෙස්වලාගෙන පුංචි මලී ඉස්සරහට ඇවිත් තිබුණේ.


"හරි පුදුමයි. එතකොට ඔයා සුරංගනාවියක් ද?" මලී පුදුමයෙන් ඇහුවා.

"ඔව්. මම සුරංගනාවියක්. මම හැමදාම උදේට මේ ලෝකෙ කාට හරි උදව්වක් කරනවා. අද ඔයා දුකෙන් ඉන්නවා දැකලා මම ආච්චි කෙනෙක් විදියට වෙස් වලාගෙන මෙතනට ආවේ ඔයාට උදව් කරන්න. ඇයි ඔයා දුකෙන් ඉන්නේ?"

සුරංගනාවිය කරුණාවෙන් ඇහුවා.

"මේ බලන්නකෝ. මගේ මල් වත්තේ මල් ඔක්කොම පරවෙලානේ. ඒකයි මම මේ දුකෙන් ඉන්නේ."

මලී මල් වත්තේ තිබුණු පරවුණ මල් සුරංගනාවිට පෙන්නුවා.



"ඔයා අනික් අයට උදව් කරන හොඳ ළමයෙක් කියල මට තේරෙනවා. ඒකනේ ඔයා මම වතුර ඉල්ලුවහම ඉක්මනින්ම වතුර ගෙනත් දුන්නේ. ඒ නිසා මම ඔයාට උදව් කරන්නම්. මට පුළුවන් ඔයාගෙ මල් ඔක්කොටම පණ අරන් දෙන්න."

සුරංගනාවි එහෙම කියනකොට මලීගෙ ඇස් සතුටින් දිලිසුණා.

සුරංගනාවි එයාගෙ මායා යෂ්ටියෙන් මලීගේ ඔක්කොම මල්වලට පණ අරන් දුන්නා.

මල් ආයෙමත් ලස්සනට හිනැහෙමින් සුළඟට වැනුණා. සමනල්ලු, මී මැස්සො ආයෙමත් මල්වලට ලංවුණා. මලීට ගොඩාක් සතුටුයි.



මලී සුරංගනාවිට ගොඩාක් ස්තූති කළා.

සුරංගනාවි සුරංගනා ලෝකෙට පියඹා ගියා.

මලී එයාගේ මල් යාළුවෝ එක්ක කතා කරමින් සතුටින් ජීවත් වුණා.



ආදර්ශය -

අන් අයට උදව් කරන කරුණාවන්ත හොඳ දරුවෝ වෙමු.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම් ගබඩාව වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වේ. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහ ලේකම්
ව්‍යාපෘති නිර්මාතෘ

ISBN 624211093-8
9 786242 110936